**සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**සති පාසල් වැඩසටහන**

**10 ශ්‍රේණිය**

**නොවැම්බර් 3වන සතිය**

## ඊජිප්තු කලා නිර්මාණ

නයිල් ගංගාව ආශ්‍රිතව ව්‍යාප්ත වූ ලෝකයේ ඉපැරණිම ශිෂ්ටාචාරයක් වන ඊජිප්තු ශිෂ්ටාචාරය ක්‍රි.පූ 3000-30 අතර කාලයට අයත් වේ. ඊජිප්තුවේ පාරාවරුන්ගේ බල පරාක්‍රමය ලොවට කියාපාන සුවිශාල පිරමීඩ, ගෘහ නිර්මාණ, චිත්‍ර, මූර්ති ආදී කලා නිර්මාණ සඳහා පදනම වූයේ ඔවුන් දැඩි ලෙස විශ්වාස කළ මරණින් මතු ආත්මය පිළිබඳ සංකල්පයයි. අමර්ණා, ගීසා සහ තීබ්ස් නගර ආශ්‍රිතව ඊජිප්තු නිර්මාණ රැසක් හමුවේ.

## ඊජිප්තු මූර්ති නිර්මාණ

1. ස්පින්ක්ස් ( Sphinx )



- ක්‍රි.පූ 2440ට පමණ අයත් ස්පින්ක්ස් මූර්තිය කුෆූ පිරමීඩය ඉදිරිපිට පිහිටි උසින් අඩි 66ක් හා පළලින් අඩි 240ක් වන ඉපැරණි මූර්තියකි.
- ඊජිප්තු කලාවේ ස්පින්ක්ස් මූර්ති රැසක් හමුවුවත් ප්‍රධාන පිරමීඩය අසල හමුවන මහා ස්පින්ක්ස් නම් මූර්තිය සුවිශේෂීය. මිනිස් මුහුණක් හා සිංහ ශරීරයක් එකට බද්ධ කිරීමෙන් සැකසුනු මෙම නිර්මාණය ඊජිප්තු කලාවේ කල්පිත මූර්ති සඳහා දියහැකි කදිම නිදසුනකි.
- ස්පින්ක්ස් නිර්මාණය පාරාවරුන්ගේ තෙදබලපරාක්‍රමය මෙන්ම ආරක්ෂාව පිළිබඳ සංකල්පය නිරූපණය කරන බව විචාරක මතයයි.

**ඉහත කරුණු ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න**

1. ස්පින්ක්ස් මූර්තිය අයත් යුගය නම් කරන්න
2. මෙම මූර්තිය හමුවන ස්ථානය කුමක්ද?
3. මෙම මූර්තියේ උස කොපමණද?
4. මෙම නිර්මාණයේ පවතින සුවිශේෂී ලක්ෂණය සඳහන් කරන්න
5. ස්පින්ක්ස් මූර්ති මගින් ඊජිප්තු පාරාවන්ගේ කුමන සංකල්පයක් පිළිබඳව සංකේතවත් වේද?

## 2. ලියන්නා හෙවත් ස්ක්‍රයිබ් ( Scribe )



- ලියන්නා හෙවත් ස්ක්‍රයිබ් මූර්තිය ඊජිප්තු මූර්ති කලාවේ පැරණි යුගයට අයත් නිර්මාණයකි.
- ස්ක්‍රයිබ් නමින් හඳුන්වන මූර්ති කිහිපයක්ම ඊජිප්තුවෙන් හමුවී ඇතත් දැනට ප්‍රංශයේ ලූවර් කෞතුකාගාරයේ තැන්පත් කර ඇති මෙම ස්ක්‍රයිබ් රුව ඊජිප්තු මූර්ති කලාවේ විශිෂ්ට නිර්මාණයකි.
- හුණු ගලින් කළ, අඩි 2ක් පමණ උස් වූ මෙය ත්‍රිකෝණාකාර ආකෘතියකින් යුතු වූවකි.
- පූර්ණ උන්නත ශිල්ප ක්‍රමයෙන් නිර්මාණය කර ඇති අතර ක්‍රිස්ටල් වර්ගයේ ගලින් ඇස්වල කුහර පුරවා ඇත.
- ක්‍රි.පූ.2600 ත් 2350 ත් අතර කාලයට අයත් මෙම මූර්තිය වර්ණ ගැන්වූ නිර්මාණයකි.
- සක්කාරා ප්‍රදේශයේ සොහොන් ගෙයකින් හමුවූ ස්ක්‍රයිබ් මූර්තිය තම ස්වාමියා පවසන යමක් ලිවීමට සැරසී සිටින ආකාරය නිරූපිතය.

**ඉහත කරුණු ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1. ස්ක්‍රයිබ් යන මෙම ප්‍රතිමාවෙන් දැක්වෙන්නේ කවුරුන්ද?
2. මෙම මූර්තිය ඊජිප්තු මූර්ති කලාවේ කිනම් යුගයකට අයත් වේද?
3. මෙම මූර්තිය අයත් කාලය නම් කරන්න
4. මෙම නිර්මාණය සඳහා භාවිත කර ඇති මාධ්‍ය කුමක්ද?
5. මෙම මූර්තියේ උස කොපමණද?
6. ස්ක්‍රයිබ් මූර්තියේ මූලික හැඩයට භාවිතකොට ඇති ආකෘතිය කුමක්ද?
7. මෙහි ශිල්ප ක්‍රමය කුමක්ද?
8. මෙය හමුවන ස්ථානය නම් කරන්න
9. මෙම මූර්තියෙන් නිරූපණය වන්නේ කුමක්ද?

3. නෙෆර්ටිටි ( Nefertiti )



- ඊජිප්තුවේ අමර්ණා යුගය හෙවත් නව රාජධානි සමයේ නිර්මාණය වූ නෙෆර්ටිටි අධිරාජිනියගේ රුව දැනට බර්ලින් කෞතුකාගාරයේ තැන්පත් කර ඇත.
- මෙය පූර්ණ උන්නත ශිල්ප ක්‍රමයට නිර්මාණය කරන ලද කාන්තා උඩුකය පිළිරුවකි.
- ඊජිප්තු කලා නිර්මාණවල දැකිය හැකි ශෛලිගත සම්ප්‍රදායෙන් මිදී ස්වභාවික ශෛලියේ ලක්ෂණ මෙම මූර්තියෙන් දැකිය හැකිය.
- උස අඟල් 20ක් වන මෙම මූර්තිය හුණු ගල් මාධ්‍යයෙන් නිර්මාණය කර වර්ණ ගන්වා ඇත.
- ඊජිප්තු පාරා රජෙකු වූ නව රාජධානි යුගයේ අක්නේටන් රජුගේ බිසව ලෙසට සැළකෙන නෙෆර්ටිටි මූර්තිය ක්‍රි.පූ 1375 පමණ කාලයට අයත්ය.
- මූර්තියට අලංකාරයක් ගෙන දෙන හිසෙහි පැළඳි විසිතුරු දිගැටි ඔටුන්න හා ගෙලෙහි පැළඳි මාලයෙන් අධිරාජිනියක සතු තේජෝබලපරාක්‍රමය පෙන්වයි.

**ඉහත කරුණු ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. මෙම මූර්තිය ඊජිප්තුවේ කිනම් යුගයකට අයත් වේද?
2. මෙම මූර්තිය අයත් කාලය නම් කරන්න
3. මෙය නිර්මාණය කිරීම සඳහා භාවිත කර ඇති ශිල්ප ක්‍රමය කුමක්ද?
4. වර්තමානයේ මෙය තැන්පත් කර ඇති ස්ථානය කුමක්ද?
5. මෙම මූර්තියේ උස කොපමණද?
6. මෙය නිර්මාණය කිරීම සඳහා භාවිත කොට ඇති මාධ්‍ය කුමක්ද?
7. නෙෆර්ටිටි රැජින ඊජිප්තුවේ නව රාජධානි යුගයේ විසූ කුමන රජුගේ බිසවද?
8. ඊජිප්තු නිර්මාණවල දැකිය හැකි ශෛලිගත බවෙන් මිදුන මෙම මූර්තියේ දැකිය හැකි ප්‍රධාන ලක්ෂණය කුමක්ද?
9. මූර්තියේ හිසෙහි පැලඳි ඔටුන්නෙන් සහ ගෙළහි පැලඳි මාලයෙන් අධිරාජිනියක සතු කිනම් ලක්ෂණය විදහා දැක්වේද?